# ශ්‍රී ලාංකේය බෞද්ධ අධ්‍යාපනික උන්නතිය විෂයෙහි අෂ්ට මූලායතනයන්ගේ දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**ඒ. එම්. ආර්. ඩබ්ලිව්. කේ. අබේසිංහ**

**හැඳින්වීම**

ශ්‍රී ලාංකේය පැරණි බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය ආරාමික අධ්‍යාපනය කේන්ද්‍ර කර ගත් අධ්‍යාපන ක්‍රමයකි. පුද්ගලයා දැනුමෙන් පමණක් නොව ඔහු තුළ මනා ශික්ෂණයක් ඇති කිරීමෙහිලා බෞද්ධ අධ්‍යාපනය අතිශය ඉවහල් විය. ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසෙහි දෙවන පෑතිස් රජු දවස සිදු වූ මහින්දාගමනයත් සමඟ ශ්‍රී ලාංකික ජන සමාජයට විවිධ ප්‍රතිලාභ රාශියක් අත් විය. ඉන්පසු දේශපාලනය, ආර්ථිකය, ආගමික, සමාජයීය හා සංස්කෘතික යන සෑම ක්ෂේත්‍රයක්ම බුදු දහමේ ආභාසය මත පෝෂණය විය. ඒ අතුරින් අපට හිමි වූ අනර්ඝතම ප්‍රතිලාභයක් ලෙස බෞද්ධ අධ්‍යාපන ක්‍රමය හඳුන්වා දිය හැකිය. මිහිඳු මාහිමියන්ගේ අනුශාසනාව මත දෙවන පෑතිස් රජු විසින් මහමෙව්නා උයනේ සීමාවන් සලකුණු කොට මෙරට පළමු බෞද්ධ මධ්‍යස්ථානයක් ලෙස මහා විහාරය ඉදිකරන්නට විය. ප්‍රථමයෙන්ම මහා විහාරය ඉදිවූයේ භික්ෂූන්ගේ නිවාසස්ථාන සහිත ආරාම සංකීර්ණයක් ලෙසින් වුවද, නේවාසික භික්ෂු පිරිස වැඩිවත් ම ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව මතු වූයෙන් එය ක්‍රමයෙන් අධ්‍යාපන ආයතනයක් බවට පරිවර්තනය විය. වළගම්බා රාජ්‍ය සමය වන තුරු ම ලංකාවේ එකම ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානය ලෙස අපරාජිතව පැවතුණේ මහා විහාරයයි. ඉන් පසුව ථේරීය සම්ප්‍රදායට පටහැනිව යමින් මෙරට තුළ බිහි වූ අනෙක් අධ්‍යාපන ආයතනය වන්නේ අභයගිරියයි. ලක්දිව ඇති වූ විවිධ බලපෑම් මත මෙරට තුළ නිකාය භේදය ඇති වූ අතර මහායාන බලපෑම් මත ජේතවනය වැනි ආරාම සංකීර්ණ ද මෙරට බිහි විය. අනුරාධපුර යුගයේ දී දක්නට ලැබුණු ප්‍රධාන ආරාමික අධ්‍යාපන මධ්‍යස්ථාන ත්‍රිත්ත්වය ලෙස මහා විහාරය, අභයගිරිය හා ජේතවනය ආදිය පෙන්වා දිය හැකිය. එමෙන්ම පසුකාලීනව මෙකී සියලු සම්ප්‍රදායන්ගෙන් නොයෙකුත් ආචාර්යවරුන් යටතේ බිහි වූ ගුරුකුල ක්‍රමයෙන් පුළුල් වී මූලායතන බවට පත් විය. මෙම අධ්‍යාපන ආයතන වියපත් අටගණය, අට අයතැන්, අෂ්ට මූලායතන ලෙස හැඳින්විණි. භාණක සම්ප්‍රදාය අභාවයට යාමත්, ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ වීමත්, ප්‍රතිපත්තියට වඩා පර්යාප්තියට ප්‍රමුඛත්වය හිමිවීමත් මෙම අෂ්ටායතන බිහිවීමට හේතු වූ බව පෙනේ. එම මූලායතන වූයේ සේලාන්තර මූලායතනය (ගලතුරුමූල), උත්තර මූලායතනය (උතුරුමූල), සරෝගාම මූලායතනය (විල්ගම්මූල), සේනාපති මූලායතනය (සෙනෙවිරත්මූල), මහනෙත් පා මූලායතනය, දක්ඛිණ මූලායතනය (දකුණුමූල), කප්පර මූලායතනය (කපාරාමූල) හා වහදු මූලායතනය යන ඒවායි. ආරාමීය අධ්‍යාපනයේ දියුණුතම අවස්ථාවක් ලෙස මෙම මූලායතන හැඳින්විය හැකිය. අනුරාධපුර යුගයේ දී ආරම්භව පොළොන්නරු යුගයේ දී සංවර්ධනීයත්වයට පත් වූ මෙම මූලායතනයන්හි දියුණුව පිණිස මෙරට රජවරුන්ගෙන් ද ලැබුණේ නොමද දායකත්වයකි. මහනෙත්පාමූල,

උතුරුමුල, වහදුමුල, සහ කපාරාමුලයන ආයතන හතර අභයගිරියට අනුබද්ධ ආයතන ලෙසත් දක්ඛිණමුල සහ සෙනෙවිරත් මුල ජේතවන ගුරුකුලයටත්, ගලතුරු මුල හා විල්ගම්මුල මහා විහාරයටත් අනුබද්ධව පැවැතිණැයි සැලකේ. එම ආයතන හරහා ද ශ්‍රී ලාංකික බුදු සමයේ අභිවර්ධනය උදෙසා සිදු වූ ශාසනික සේවාව මෙතෙකැයි කිව නොහැකිය. මෙලෙස පැරණි බෞද්ධ අධ්‍යාපන ආයතන රැසක් ලාංකික සමාජය තුළ ද බිහිව පැවති අතර මහාවිහාරය, අභයගිරිය, ජේතවනය මුල් තැනක් ගත්තා සේම අෂ්ට මූලායතන ද ඒ අතර කැපී පෙනුණි. එමගින් මෙරට බෞද්ධ අධ්‍යාපනය අභිවර්ධනයෙහිලා ඉටු වූයේ සුවිශේෂී දායකත්වයකි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම ශාස්ත්‍රීය පර්යේෂණය සිදු කිරීමේදී තොරතුරු ලබා ගැනීම සඳහා අනුගමනය කරන පර්යේෂණ ක්‍රමවේදය වන්නේ සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනයයි. මෙහිදී ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික මූලාශ්‍රය පාදක කර ගනිමින් තොරතුරු විමර්ශනය කිරීම සිදු කෙරේ.

**පර්යේෂණ අරමුණ හා වැදගත්කම**

ලාංකික සමාජයේ පැවැති ආරාම කේන්ද්‍ර කර ගත් අධ්‍යාපන ආයතනයක් ලෙස අෂ්ට මූලායතන යනු මොනවාදැයි හඳුනා ගැනීම හා එමගින් මෙරට බෞද්ධ අධ්‍යාපනයේ අභිවර්ධනයෙහිලා සිදු වූ සේවාව පිළිබඳ විමර්ශනය කිරීම ප්‍රධාන අරමුණ වේ.

**පර්යේෂණ සාකච්ඡාව**

වත්මන් සමාජය තුළ පැරණි ආරාමීය අධ්‍යාපනය පිළිබඳ අඩු අවධානයක් යොමු වන බැවින් ඒ පිළිබදව ඉස්මතු කරලීම කාලීන අවශ්‍යතාවයකි. මන්ද නූතන ජන සමාජයෙන් තුරන්ව යමින් පවතින පැරණි ලංකාවේ ආරාම මුල් කොට ගත් බෞද්ධ අධ්‍යාපනයේ සාධනීය ලක්ෂණ නූතන අධ්‍යාපන ක්‍රමයට උකහා ගැනීම වැදගත් වනු නොඅනුමාන වන නිසාවෙනි. පැරණි ලාංකික සමාජයේ පැවැති ආරාම කේන්ද්‍ර කොට ගත් බෞද්ධ අධ්‍යාපන ආයතන අතර ප්‍රමුඛස්ථානයක් අෂ්ට මූලායතනවලට හිමි වුවද ඒ පිළිබඳව නොදන්නා පිරිස බොහෝය. මෙහිදී අෂ්ට මූලායතන යනු මොනවාද යන්නත්, එහි පැවැති අධ්‍යාපන ක්‍රමවේදය කෙබඳු වූයේ ද යන්න හා මෙම මූලායතනය මගින් ශ්‍රී ලාංකික බෞද්ධ අධ්‍යාපනයේ උන්නතිය විෂයෙහි වූ දායකත්වය කෙබඳු වූයේදැයි අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ දී සාකච්ඡාවට බඳුන් වේ.

**නිගමනය**

ශ්‍රී ලංකාවේ පැවැති මෙම අෂ්ට මූලායතනයන් තුළ වූ අධ්‍යාපනය ක්‍රමවේදය විධිමත් වූවා පමණක් නොව එතුළින් බිහි වූ ශිෂ්‍යයන් දැනුමෙන් මෙන්ම කුසලතා හා ආකල්පවලින් ද පරිපූර්ණ වූ විනයානුකූල පැවැත්මකින් හෙබි පුද්ගලයෝ වූහ. මනා ගුරු සිසු සබඳතාව ඔපවත් කළ මෙම අධ්‍යාපන ක්‍රමය ඵලදායිතාවයෙන් යුත් සාර්ථක අධ්‍යාපන ක්‍රමවේදයක් ලෙස හඳුනා ගත හැකිය. මෙම මූලායතන තුළින් බිහි වූ විද්වතුන් එහි යථාර්ථය මොනවට කියාපායි. ඒ අනුව මෙරට බෞද්ධ අධ්‍යාපනයේ උන්නතිය විෂයෙහි මෙම මූලායතනයන්ගෙන් නොමද දායකත්වයක් ලැබුණු බව තහවුරු කළ හැකිය.

**ප්‍රමුඛ පදඃ** බුදුසමය, ආරාමීය අධ්‍යාපනය, භික්ෂුව, පිරිවෙන, ලාංකික සමාජය

## මූලාශ්‍රය ග්‍රන්ථ


අධිකාරී, අභයරත්න. (1991). ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහසඟන. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

අබේසිංහ, වික්‍රමනායක, (1999). පැරණි ශ්‍රී ලංකාවේ ආරාම අධ්‍යාපනය. නුගේගොඩ: පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්.

ගුණවර්ධන, රණවීර. (1993). සිවුර හා නගුල. කොළඹ 05: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

ධම්මතිලක හිමි, පැලවත්තේ. (1999). බෞද්ධ අධ්‍යාපනය. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පඤ්ඤාලෝක හිමි, මීගොඩ. (2002). ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රාහුල හිමි, වල්පොළ. (1988). ලක්දිව බුදුසමයේ ඉතිහාසය. කොළඹ, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ලංකාවේ අධ්‍යාපනය. (1969). සියවස ප්‍රකාශනය. පළමු කාණ්ඩය, ලංකාවේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය.